ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

***

## <u>පුවත්පත් නිවේදනය</u>

## <u>ඉන්දියාව ප්‍රදාන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන ඉහළ නංවයි</u>

ශ්‍රී ලංකා ආර්ථිකයේ වේගවත් වෙනස්වීම් සඳහා ප්‍රතිචාර දක්වමින්, ඉන්දියානු රජය දිවයින පුරා විවිධ ප්‍රදාන ව්‍යාපෘතීන් සඳහා මූල්‍ය ප්‍රතිපාදන ඉහළ නංවා ඇත. ඉන්දියා - ශ්‍රී ලංකා ඉහළ බලපෑමක් සහිත ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති රාමුව (HICDP) යටතේ දැනට ක්‍රියාත්මක ව්‍යාපෘතීන් 9ක් සඳහා මූල්‍ය ප්‍රතිපාදන 50% ක් දක්වා ඉහළ නංවා ඇත. මෙම ඉහළ නැංවීමෙන් අනතුරුව මෙම ව්‍යාපෘති 9 සඳහා සමස්ත මූල්‍ය කැපවීම ශ්‍රී ලංකා රුපියල් බිලියන 3කට ආසන්න වේ. මෙම ව්‍යාපෘතීන් අධ්‍යාපනය, සෞඛ්‍ය, කෘෂිකර්ම වැනි විවිධ අංශ පුරා පැතිරී පවතී.

2. ඉන්දියානු රජය HICDP රාමුව යටතේ ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25ම ආවරණය කරමින් ප්‍රදාන ව්‍යාපෘතීන් 60ක් සම්පූර්ණ කර ඇත. මෙයට අමතරව, තවත් ව්‍යාපෘතීන් 20ක් ක්‍රියාත්මක කිරීමේ විවිධ අදියරයන් හි පවතී. HICDP රාමුව 2005 වසරේදී දෙරට අතර අත්සන් තැබුණු අතර තෙවරක් අලුත් කරන ලදී. එම එක් එක් අවස්ථාවේ දී HICDP රාමුව වසර 5ක් දක්වා අලුත් කරන ලදී. ඉන්දියානු රජය විසින් කේවල ව්‍යාපෘතීන් සඳහා

උපරිම සීමාව මෙන්ම මෙම රාමුව යටතේ සමස්ත මූල්‍ය ප්‍රාග්ධන වියදම 2023 ජනවාරි මාසයේදී දෙගුණ කරන ලදී.

3. ශ්‍රී ලංකාව තුළ ඉන්දියානු රජයේ සමස්ත සංවර්ධන සහයෝගිතා කළඹ ඇමරිකානු ඩොලර් බිලියන 5ක් පමණ වන අතර එයින් ඇමරිකානු ඩොලර් මිලියන 600ක් ප්‍රදාන වේ. ඉන්දියානු රජය විසින් ක්‍රියාත්මක කරන ඉල්ලුම මත පදනම් වන සහ ජනතා කේන්ද්‍රීය ව්‍යාපෘතීන් යටිතල පහසුකම් සංවර්ධනය, නිවාස, ජීවනෝපාය සහය වැනි විවිධ ක්ෂේත්‍ර පුරා පැතිරී ඇත. 1990 හදිසි ගිලන්රථ සේවාව, දුම්රිය මාර්ග ප්‍රතිසංස්කරණය, ඒකාබද්ධ ජල ව්‍යාපෘතීන්, ඉන්දීය නිවාස ව්‍යාපෘතිය සහ යාපනය සංස්කෘතික මධ්‍යස්ථානය යනාදිය ඉන්දියානු රජය විසින් ශ්‍රී ලංකාවේ සිදු කර ඇති සුවිශේෂී ව්‍යාපෘතීන් වේ.

***

**කොළඹ**
**2023 සැප්තැම්බර් 1**